GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

# කොරෝනා (COVID 19) රෝගයේ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව 2020 මාර්තු 31 (මධ්‍යහ්න 12.00) වාර්තාව

මීට ඉහතදි 2020 මාර්තු 24 හා 27 වන දිනයන්හිදි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ඉදිරිපත් කල කොරෝනා රෝගයේ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවන්ට වැඩිමනත් වශයෙනි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ රෝග පැතිරීම පිළිබඳ වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාව IIIa මට්ටමේ (නිවෙස් ආශ්‍රිත රෝගී සමූහයන්) සිටින අතර IIIb තත්ත්වයට (ගම හෝ නගරය තුල කුඩා රෝගී කණ්ඩායම් සමූහ) හෝ IV (රෝගය සමාජය තුල පැතිරීමේ අවස්ථාව) මට්ටමට ඇතුලු වීමට දැඩි අවදානමක් මේ වන විට මතුව ඇත.

දැනට සිදුකර ඇති අධ්‍යයනයන්ට අනුව මේ මොහොතේ ගත හැකි සියලුම දැඩික්‍රියාමාර්ගය හා උග්‍ර ප්‍රතිචාර හරහා කොරෝනා රෝග ව්‍යාප්තිය මර්ධනය කර ගැනීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය සියලුම සාමාජික රටවල් වලට දැඩි ලෙස අවවාද කරයි. ශ්‍රී ලංකාව තුලද ක්‍රියාත්මක කල හැකි එවන් පියවර ගණනාවකි.

1. 80% කට වඩා වැඩි සමාජ දුරස්ථකරණයක් තහවුරු කිරීම.

   මේ වන විට පවතින තත්ත්වය අධ්‍යයනය කිරීමේදි ශ්‍රී ලංකාව තුල සමාජ දූරස්ථකරණ මට්ටම් 3 ක් පවතින බව පෙනි යයි.

   a) සම්පූර්ණයෙන්ම හුදකලා කරන ලද ගම්මාන හා නගර - සමාජ දූරස්ථකරණය 90% කට වඩා වැඩිය (ඉතා සතුටු දායකය)
   b) දැඩි අවදානම් කලාප ලෙස සලකා ඇදිරි නීතිය අඛණ්ඩව ක්‍රියාත්මක වන ප්‍රදේශ - සමාජ දූරස්ථකරණය 70% කට වඩා වැඩිය (සතුටු දායකය)
   c) තාවකාලික පියවරක් ලෙස ඇදිරි නීතිය විටින් විට ඉවත් කරන ප්‍රදේශ - සමාජ දූරස්ථකරණය 50% කට වඩා අඩු මට්ටමකට පහත වැටේ (ඉතා දූර්වල මෙන්ම භයානක තත්ත්වයකි)

   සමාජ දූරස්ථකරණය 80% ට වැඩි මට්ටමේ පවත්වා ගැනිම සඳහා ගත යුතු සියලු ක්‍රියාමාර්ග දිවයින පුරා ඒකාකාරි ලෙස ක්‍රියාවට නැංවිය යුතු බව අපි නිර්දේශ කරමු.

   ඒ සඳහා,

   - සියලු පුරවැසියන් හැකිතාක් දුරට තම නිවස තුලටම වී සිටීමේ වැදගත්කම නිරන්තරයෙන් අවධාරණය කිරීම.

- බැංකු කටයුතු, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා ඖෂධමය අවශ්‍යතාවයන් නිවස තුලටම ලගා වන ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම.
- විටින් විට ඇදිරි නීතිය ලිහිල් කිරීම වහාම නැවැත්වීම.
- දිස්ත්‍රික් අතර සංචරණ හැකිතාක් දුරට අවම කිරීම.
- රෝග ව්‍යාප්තිය රට පුරා සිදු කල හැකි පරිදි ජනතාව එක් රැස් වන අධි අනතුරු දායක ස්ථාන (Hot Spots) පිලිබඳ දැඩි තීන්දු තීරණ වලට එලඹීම.

  උදා - ආර්ථික වෙළඳ මධ්‍යස්ථාන (දඹුල්ල)
  ධීවර වරායන් (තංගල්ල තුඩා වැල්ල ධීවර වරාය හා මීගමුව ලෙල්ලම)
  මැනිං වෙළඳපොල ඇතුලු ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථාන
  තේ කර්මාන්ත ශාලා

2. රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ජනතාව විසින් පෞද්ගලික සනීපාරක්ෂාව සම්බන්ධව නිරන්තර අවධානය යොමු කිරීම. (උදා - නිවැරදිව අත් සේදීම)

මීට අමතරව පොදු ජනතාව විසින් මුඛ ආවරණ පැලදීම පිළිබඳ දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති උපදෙස් නැවත සමාලෝචනය කිරීම සඳහා කාලය එලඹෙමින් පවතින බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ලෙස අවධාරණය කරමු.

පොදු ජනතාව විසින් මුඛ ආවරණ නිවැරදි ලෙස භාවිත කිරීම හරහා දැනට ශ්‍රී ලංකාව සිටින IIIa සිට IIIb හෝ IV වෙනි මට්ටම දක්වා රෝගය ව්‍යාප්ත වීම පාලනය කර ගත හැකි බව විශේෂඥයන් පෙන්වා දෙයි. ඒ අනුව මේ පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධානත්වයෙන් තාක්ෂණික කමිටුවක් කැඳවිය යුතු බව අප මේ වන විටත් අදාල බලධාරින් වෙත දැනුම් දී ඇත.

3. රෝහල් පද්ධතිය තුල ධාරිතාව ඉහළ නැංවීම.

ඉදිරියේදී සමාජය තුල රෝගය පැතිරීමේ අවධියට ඇතුලු වුවහොත් ඒ සඳහා මුහුණ දීමට රෝහල් වල භෞතික හා මානව සම්පත් ධාරිතාව වැඩි කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

**A. භෞතික සම්පත්**

ඒ සඳහා දැඩිසත්කාර ඒකක ඇඳන් ප්‍රමාණය වැඩි කර ගත යුතුය. ඒ සඳහා දැනටමත් අප විසින් විස්තරාත්මක යෝජනාවලියක් සෞඛ්‍ය බලධාරින්ට යොමු කර තිබුනද තවමත් ඒ සඳහා සතුටුදායක ප්‍රතිචාර ලැබී නොතිබීම කනගාටුදායකය.

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

ලෝකය පුරා අත්දැකීම් අධ්‍යයනය කිරීමේදී රෝග ප්‍රතිකාර සේවාවන් වඩාත් ප්‍රශස්ත ලෙස ලබා දීම සඳහා කොරෝනා රෝගයට ප්‍රතිකාර කිරීමේ විශේෂිත රෝහල් ස්ථාපිත කිරීමේ වැදගත්කම පෙනී යයි. මේ වන විටත් එලෙසින් හඳුනාගත් රෝහල් කිහිපයක් ඇතත් අධි වසංගත තත්ත්වයකට මුහුණ දීම සඳහා ඒවායේ ධාරිතාව කිසිසේත්ම ප්‍රමාණවත් නොමැත. ඒ අනුව මේ සඳහා වඩාත් ගැලපෙන මධ්‍යස්ථානයක් ලෙස කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල අපි යෝජනා කරමු. ඒ සඳහා වන යෝජනා මේ වන විටත් අතිගරු ජනාධිපතිතුමා ඇතුලු බලධාරීන් වෙත යොමු කර ඇත.

**B. මානව සම්පත්**

මානව සම්පත් ධාරිතාව ඉහල මට්ටමක තබා ගැනීම ඉතා වැදගත්ය. එහිදී වෛද්‍යවරුන් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල නිරෝධායනය කිරීමට සිදුවුවහොත් හෝ ඒ අයට රෝගය වැළඳුනහොත් මානව සම්පත් ධාරිතාව අසාමාන්‍ය ලෙස අඩුවනු ඇත. එබැවින් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයන්ට අවශ්‍ය පෞද්ගලික ආරක්ෂණ උපකරණ අඛණ්ඩව සැපයීම ඉතා වැදගත් වෙයි.

පසුගිය දින කිහිපය තුල ඇතැම් රෝගීන් සත්‍ය වසන් කිරීම නිසා ඉතා අවාසනාවන්ත ලෙස රෝහල් 04 ක වෛද්‍යවරුන් ඇතුලු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු ප්‍රමාණයක් නිරෝධායනය සඳහා යොමු කර, ඇතැම් ඒකක සම්පූර්ණයෙන්ම වසා දැමීමට අද වන විට සිදු වී ඇත. (උදා - මීගමුව, ශ්‍රී ජයවර්ධනපුර, කලුබෝවිල, රාගම හා ද සොයිසා රෝහල)

ඒ අනුව ඉදිරියේදී රෝගීන් රෝහලට පැමිණෙන විට ඒ අයට ප්‍රතිකාර කිරීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල වල දැඩි හිඟයක් නිර්මාණය වීමට නියමිතය.

4. රෝගීන් සමග සමීප සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයන් (ස්පර්ශකයන්) හඳුනා ගෙන ඒ අය නිරෝධායනයට ලක් කිරීම

මෙහිදී අවම වශයෙන් 80% කට වඩා වැඩි ස්පර්ෂකයන් පිරිසක් නිරෝධායනයට ලක් වීම ඉදිරි රෝග ව්‍යාප්තිය පාලනය සඳහා අත්‍යවශ්‍ය වෙයි.

5. කොරෝනා රෝගීන් හඳුනා ගැනීමේ පරීක්ෂණ පහසුකම් වඩාත් පුළුල් කිරීම

කොරෝනා රෝගීන්ගෙන් 80% කට පමණ සුලු රෝග ලක්ෂණ පමණක් පෙන්වයි. එබැවින් ස්පර්ෂකයින් හඳුනා ගත්තද රෝගීන් හඳුනා ගැනීම මග හැරීමට ඉඩ ඇත. එමෙන්ම හඳුනාගන්නා සියලු ස්පර්ශකයන් රසායනාගාර පරීක්ෂණ සඳහා යොමු නොවෙයි.

ප්‍රතිදේහ හඳුනා ගැනීමේ පරීක්ෂණ මගින් කෙටි කාලයක් තුල (විනාඩි 15 කින් පමණ) රෝගීන් තහවුරු කිරීමේ පරීක්ෂණ ක්‍රමවේද (Rapid Test) කිහිපයක් මේ වන විට ලොව පුරා විවිධ රටවල හඳුන්වා දී ඇත. එම ක්‍රමවේදයන් අප රට තුලටද හඳුන්වා දීමට ඇති හැකියාව වහා සොයා බැලිය යුතුය.

ලෝක සෞඛ්‍ය සංවිධානයද මේ වන විට නිර්දේශ කරන පරිදි සැකකටයුතු සියලුදෙනා පරීක්ෂාවන්ට ලක්කොට රෝගය වැලදී ඇතැයි තහවුරු වන සියළු දෙනා සමාජයේ වෙන් කිරීම ඉදිරි රෝග ව්‍යාප්තිය පාලනය සඳහා අත්‍යාවශ්‍ය වේ.
එබැවින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධානත්වයෙන් රැස්වන තාක්ෂණික කමිටුවේදී දැනට ඇතැම් රටවල හඳුන්වා දී ඇති Rapid Test ලංකාවට හඳුන්වා දීමේ හැකියාව සාකච්ඡා කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

6. රෝග ප්‍රතිකාර සඳහා සුවිශේෂිත ඖෂධ හඳුනා ගැනීම

   මේ වන විට ලෝකය පුරා මේ පිළිබඳව විවිධ පර්යේෂණ සිදු වෙමින් පවතී.

   සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික කමිටුව හා ජනාධිපති කාර්ය සාධක බලකායේ පර්යේෂණ කණ්ඩායම් මේ වන විට මේ පිළිබඳව අවධානය යොමු කර ඇත.

   ශ්‍රී ලංකාව තුල හයිඩ්‍රොක්සි ක්ලෝරෝක්වීන් (Hydroxy Chlroquine) ඖෂධය භාවිත කිරීම මේ වන විට ආරම්භ වී ඇත.

   රෝග ප්‍රතිකාරයක් ලෙස AVIGAN නම් ප්‍රතිවෛරස කාණ්ඩයේ ඖෂධය භාවිත කිරීම පිළිබද ජපානය තුල කතා බහක් ඇති වුවද අද වන විට විශේෂඥයන් තහවුරු කරනුයේ එම ඖෂධය කොරෝනා රෝග තත්ත්වයට සාර්ථක ප්‍රතිකාරයක් නොවන බවයි.

7. ගුවන් තොටුපල හා වරායන් වසා දැමීම මගින් ගෝලීය වසංගත තත්ත්වය තුල නව රෝගීන් වෙනත් රට වලින් ලංකාවට පැමිණීම මේ වන විට නවතා දමා ඇත. පවතින ගෝලීය වසංගත තත්ත්වය පාලනය වනතුරු කිසිසේත්ම ගුවන් තොටුපල හා වරායන් විවෘත නොකල යුතු බවට අපි නිර්දේශ කරමු.

වසංගත විද්‍යානුකූල අනාවැකි අනුව ශ්‍රී ලංකාව තුල දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග මධ්‍යයේ වුවද රෝගීන් උපරිමයෙන් වාර්තා වීම අප්‍රේල් මස අවසානය දක්වා සිදු විය හැක.

රෝහල් පද්ධතියේ උපරිම ධාරිතාව කරා ලගා නොවී COVID - 19 රෝග තත්ත්වය රට තුල පාලනය කිරීම සඳහා අප විසින් ඉහත පෙන්වා දී ඇති කරුණු තවදුරටත් ප්‍රමාද නොකොට ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වන බව අවධාරණය කරමු.

**රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය - 2020 මාර්තු 31 වැනි දින (මධ්‍යාහ්න 12.00)**